

ලක්රුහුණු මාසික දහම් පත්‍රය

# අමා ගඟුල 2015 NOVEMBER

## අනුවණයා වස්තු තණ්හාව නිසා නසින හැටි හඳුනා ගනිමු.

ශ්‍රී. බු. ව. 2559 ක්වූ ඉල් මස කලාපය, රා. ව. 2015 ක් වූ නොවැම්බර් මස 25 වන දින

මාතර, ශ්‍රී සුදර්ශි විද්‍යායතන නියෝජ්‍ය පරිවෙනාධිපති දෙව්නුවර, කපුගම ශ්‍රී සුධර්මාරාමාධිපති

ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

# අනුවණයා වස්තු තණ්හාව නිසා නසින හැටි හඳුනා ගනිමු.

(ධම්ම පදය තණ්හාවර්ගය ඇසුරිනි)

ගරු සවාමින් වහන්ස - පින්වත්නි,

හනනති භොගා දුමෙමධං - නො වෙ පාර ගවෙසිනො

භොග තණහාය දුමෙමධො - හනති අඤෙඤව අතතනනති.

''භෝග සම්පත් අනුවණයා නසත් පරතෙර සොයන පුද්ගලයින් නොනසත් - අනුවණයා අනුන් නසන ගමනේ භෝග සම්පත් තණ්හාව නිසා තමාද නසා ගනී.''

අද ඉල් පුර පසළොස්වක පොහොය දිනයයි. මෙම පොහොය දිනයෙහි මෙම ධර්ම පත්‍රිකාවෙන් විස්තර කර දීමට බලාපොරොත්තු වන්නේ අනුවණයා වස්තු තණ්හාව නිසා  තම ජිවිතයත් නසාගෙන අනුන්ගේ ජිවිතද නසමින් දුකට පත් වන ආකාරයයි. මෙහිදී මූලාශ්‍රය හැටියට යොදා ගන්නේ ධම්ම පදයේ තණ්හා වර්ගයේ ඉහත සඳහන් ගාථා ධර්මයයි.

මෙම ඉල් පුර පසළොස්වක පොහොය දිනය   ශාසන ඉතිහාසය තුළ ඉතා වැදගත් දිනයකි. බුදුරජාණන් වහන්සේ බරණැස ඉසිපතන නම් මිගදායෙහි ප්‍රථම වස් කාලය අවසන් කොට වස් පවාරණය කළ රහත් හැටනම අමතා දේශනා කළේ ''චරථ භිකඛවෙ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය ලොකානුකමපාය අතථාය හිතාය සුඛාය දෙවමනුසසානං'' මහණෙනි චාරිකාවෙහි හැසිරෙමින් ධර්මය දේශනා කරමින් බොහෝ ජනයාට හිතසුව පිණිස කටයුතු කරන්න. මෙසේ ධර්මය ප්‍රචාරය කිරීම සඳහා යොදවන ලද්දේ අද වැනි ඉල්පුර පෝය දිනයකයි. භික්ෂූන් වහන්සේලා එසේ පිටත් කර යවා බුදුරජාණන් වහන්සේ උරුවෙල් දනව්වට වැඩම කර එහි ජීවත්ව සිටි උරුවෙල් කාශ්‍යප, නදී

කාෂ්‍යප, ගයා කාෂ්‍යප යන ජටිල තවුසන් ඇතුළු පිරිස පැවිදි කරවා , ඔවුන්ට දහම් දෙසා රහත් භාවයට පත් කළේ ද අද වැනි ඉල්පුර පොහොය දිනයකය.

බුදුරජාණන් වහන්සේ අසිරිමත් පුද පෙළ හර දක්වමින් සංකස්ස නුවරට වැඩම කිරිමේදී සිදු වූ ප්‍රාර්තිහාරය දැක සතුටට පත් මෛත්‍රීය බෝසතාණන් වහන්සේ තම පිරිවර සමග ආර්ය මෛත්‍රීය භික්ෂුන් වහන්සේ නමින් පැවිදි විය. පසුව තමාට ලැබුණු අගනා වස්ත්‍ර දෙකක් බුදුරජාණන් වහන්සේට පූජා කොට තමා අනාගතයෙහි මෛත්‍රී නමින් බුදුවන බවට විවරණය ලැබුවේද අද වැනි පොහොය දිනයකය. අග්‍රශ්‍රාවක සැරියුත් මාහිමියන් ගේ මෑණියන් සෝවාන් බවට පත්වූයේද , සැරියුත් මාහිමියන් ගේ පිරිනිවන් පෑම සිදු වුයේද අද

වැනි පොහොය දිනකය. මෙම වසරේ පෙරවස් විසූ භික්ෂුන් වහන්සේලාට කඨින චීවර පූජා භාර ගත හැකි. අවසාන දිනය වන්නේද අද  දිනයේදීය.

මේ උතුම් පොහොය දිනයෙහි අප බලාපොරොත්තු වන්නේ වස්තු තණ්හාව නිසා වැනසී යන පුද්ගලයා හඳුනාගෙන එවැනි දුර්ගුණ වලින් වැළකී සැනසීම ඇති කර දීමටයි. බුදුරජාණන් වහන්සේ මෙම දේශනාව සිදු කළේ අපුත්තක නම් සිටුවරයෙක් නිමිති කර ගෙනය. කොසොල් රජතුමාගේ රාජ්‍යයෙහි මහා ධනයකට හිමිකම් කී සිටුවරයෙක් ජීවත් විය. ඔහුට දරුවන් සිටියේ නැත. ඒ නිසාම අපුත්තක සිටු යනුවෙන් හඳුන්වනු ලැබීය. ඔහුගේ ධනයට හිමිකම් කියන කිසිදු ඥාතිවරයෙක් නොවු නිසා ඒ සියලු ධනය කොසොල් රජතුමාට අයිති විය. රජතුමා ඒ සියලු ධනය රාජ්‍ය භාණ්ඩාගාරයට යවා බුදුරජාණන් වහන්සේ හමුවීමට ගියේ මෙම නුවණ නැති අපුත්තක සිටාණන් පිළිබඳ ප්‍රවෘර්තිය සැළකිරීමටයි. මහ දවල් පැමිණි කොසොල් රජතුමාගෙන් බුදුන් වහන්සේ ඇසුවේ "මහ රජ මේ දවල් කුමක් සඳහා පැමිණියේද කියායි." එවිට රජතුමා මේ අවාසනාවන්ත සිටුවරයාගේ ජිවිත කතාව ගෙන හැර පෑහ.

ස්වාමීනි, මොහුට අයත්ව තිබු වස්තු සම්භාරය ගණන්කර කීමටද නොහැක. නමුත් ස්වාමීනි මෙම සිටුවරයා හරියට කෑමක් නොගත්තේය. මොහු අනුභව කළේ කාඩි හොදි සහ නිවුඩු හාලේ බත්ය. (කණාජකං භුඤ්ජති බිලඩග දුතියං) හොඳ ඇඳුමක් ඇන්දේ නැත. හණ රෙද්දෙන් කරන ලද තුන් මූට්ටු සරම  ඇඳුමක්  විය. (සාණං ධාරෙති තිපකඛවසනං) මොහු හොඳ සුව පහසු වාහන වල ගමන් කළේ නැත. ඔහු ගමන් කළේ කොළ කූඩයක් හිසලා ගෙනය. දිරාපු කරත්තෙකිනි.(ජජ්ජර රථකෙන යාති පණ්ණවඡතතකෙන ධාරියමානෙන) රජතුමා අපුත්තක සිටාණන් ගැන කී දේ අසා සිටි බුදුරජාණන් වහන්සේ රජතුමාගෙන් මෙසේ අසයි. රජතුමාගෙන් මෙසේ අසයි. රජතුමනි එසේ වන්නට හේතු දනීද, නැත ස්වාමීනි. එවිට බුදුරජාණන් වහන්සේ මොහුගේ තත්වය   පැහැදිලි කළ සේක.

රජතුමනි, මේ අපුත්තක නම් සිටුවරයා පෙර තගරසිඛී නම් පසේ බුදුරජාණන් වහන්සේ නමකට දෙන ලද දානයක් නිසා මේ සම්පත් ලැබු බවත්,දීමෙන් පසු හිත නරක් කර ගත් නිසා ලැබුණු වස්තුව ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වු බවත් පැවසීය. මේ සිටුවරයා කිසිවක් කිසිවෙකුට දෙන කෙනෙකු නොවේ. නමුත් එක් දිනයක නගරසිඛී නම් පසේ බුදුරජාණන් වහන්සේ සිටු ගෙදරට පිඬු පිණිස වැඩි අවස්ථාවේ දී තම සේවකයින්ට කථා කොට පසේ බුදුහාමුදුරුවන්ට දානය දෙන ලෙස කියා සිටියහ. සේවකයින් සිටුතුමාගේ කීම පරිදි පාත්‍රය පුරා පිණ්ඩපාතය බෙදූහ. මෙය දුටු අපුත්තක සිටුතුමා සිත අසතුටු කර ගත්හ. මගේ සේවකයෙකුට මේ ආහාර ටික දුන්නා නම් ඔහුගෙන් කිසියම් සේවයක් ලබාගන්නට තිබිණි. මේ දානයෙන් මට කිසිදු ප්‍රයෝජනයක් නැත. දානයක් දීමට සිතා දන් දුන් බැවින් ඔහුට සිටු තනතුර ලැබුණි. නමුත් සිත අසතුටු කරගත් නිසා ලැබුණු සම්පත් වලින් ප්‍රයොජන ගැනීමට නොහැකි විය.

මීට අමතරව මේ නුවණ නැති අපුත්තක සිටාණන් තවත් අපරාධයක් කර ඇත. මොහුට සිටියේ එකම සහෝදරයෙක් පමණි. එම සහෝදරයා මිය යන විට ඔහුට කුඩා පුතෙක් ලැබී තිබුණි. මේ අපුත්තක නම් සිටුවරයා ඒ ආත්මයේ දී අර සහෝදරයාගේ කුඩා පුතු අතින් අල්ලා ගෙන එහෙ මෙහෙ යයි.ඒ අවස්ථාවල දී අර කුඩා දරුවා තම ලොකු තාත්තාගේ අතේ එල්ලී ගමන් කරනවිට මේ අපේ තාත්තාගේ කරත්තයයි, මේ අපේ තාත්තාගේ ගොනාය යනුවෙන් පවසයි. මේ ඇසූ ඔහු මෙසේ සිතයි කුඩා කලත් මෙසේ සිතන මේ දරුවා වැඩි වයසට පත් වූ පසු මට මහත් කරදරයක් විය හැක. මෙසේ සිතා බෙල්ල හිර කොට මරා දැමීය. මේ බලවත් අකුසල කර්මය නිසා ඔහුට දරු සම්පත්තිය නැති වූ බව සඳහන් කරයි. පෙර ජිවත් වූ අපුත්තක සිටු නැමැති අනුවණයා වස්තු තණ්හාව න

සඳහන් කරයි. පෙර ජිවත් වූ අපුත්තක සිටු නැමැති අනුවණයා වස්තු තණ්හාව නිසා විනාශ වූ හැටි මෙයින් අවබෝධ කර ගත හැකිය.

බෝහෝ දුර කාලයක භාරතයේ සිදු වූ මෙම තත්වයට හේතුව කුමක්ද කියා සොයා බැලීම නූතනයෙහි ජීවත් වන අයටත් ඉතා වැදගත්ය. දානයක් දෙන විට අවස්ථා තුනක් ගැන බණ පොතේ සඳහන් වේ. දානය දීමට පෙර අවස්ථාවේ සිත පූර්ව චෙතනාවයි.දානය දෙන අවස්ථාවේ සිත මුඤ්චන චේතනාවයි. දානය දී අවසන් වූ අවස්ථාවේ සිත අපර චේතනාවයි. අංගුත්තර නිකායේ ඡළඞ්ගදාන නම් සූත්‍රයක් එයි.එහිදී දේශනා කරන්නේ ප්‍රතිග්‍රාහක පක්ෂයෙන් කරුණු තුනක් හා දායක පක්ෂයෙන් කරුණු තුනක් වශයෙන් අංග හයකින් යුක්ත දානය මහත් ඵල මහානිශංස වන බවයි. එහිදී ඉහත කී අංග තුන ගැන විස්තර වෙයි.(පූබෙබව දානා සුමනෝ හෝති. දදං චිතතං පසාදෙති,දත්වා අතතමනො හොති) ඉහත කී සිටුවරයා සිත සතුටින් දානය දීමට තිරණය කළත් දානය දෙන අවස්ථාවේ දීත් ඉන් පසුත් සිත අසතුටු කර ගත්හ. මේ නිසා සිදු වු විපත කොතරම් විශාලද ? කෑම් බිම්, ඇඳුම් පැලඳුම් ගමනා ගමන පහසුකම් කොතරම් තිබුණත් ඒවා ප්‍රයෝජනයට ගැනීමට සිත නොනැමේග මේ නිසා මිල මුදල් අපේක්ෂාවෙන්ම කටයුතු කරන පුද්ගලයා නැසී යන හැටි අවබෝධ කරගත හැකග නමුත් සිත සතුටින් කර්මය හා කර්ම ඵලය ගැන විශ්වාසයෙන් දන්දෙන පුද්ගලයා යන හැම තැනකදීම සතුටු වන බව කියයිල ගැමි කවියා මේ ගැන කිවේ තුන්හිත පහදා ගෙන දුන් දානය උන් ගිය ගිය තැන ලැබෙය නිධානය'' යනුවෙනි. අපුත්තක සිටුතුමා දානය දුන් නිසා නිධානය ලැබුණත් ඒවා පරිහරණය කිරිමට නොහැකි වුයේ දන් දී සිත අසතුටු කර ගත් නිසායි.

වර්තමාන සමාජයේ ද, මෙවැනි අපුත්තක සිටාණවරු සිටු දේව්වරු දැකිය හැක. දානයක් දෙනවිට තම සිතේ බල පවත්වන රාග, ද්වේෂ, මෝහ යන අකුසල් මුල් තුන නැති කර ගන්නා ආකාරයට එය දිය යුතුය. නමුත් සමහරු දන් දෙන්නේ රාග, ද්වේෂ, මෝහ වැඩි වන ආකාරයටයි. දානයක් දෙන පුද්ගලයා දිව්‍යලෝක වල සැප සම්පත් ප්‍රර්ථනා කර දෙව් ලොව යෑම බුදු දහම හඳුන්වන්නේ අපේ ජීවිතය අමනුෂ්‍යයින් විසින් ගැනීමක් ලෙසටයි. එයින් කියවෙන්නේ දන් දී දෙව්ලොව ගොස් සසර දික් නොකර ගත යුතු බවයි.

මේ සියලු කරුණු වලින් පැහැදිලි කරන්නේ පරිත්‍යාගය සිදු කිරිමේ දී නිර්ලෝභී චේතනාවම පෙරටු කර ගත යුතු බවයි. අද මේ පොහොය දිනයෙන් කඨින පිංකම් අවසන් වෙයි. මේ පිංකම් අවසානයෙහි කඨිනානිශංස දේශනා කරනු ලබයි. ඒ බොහෝ කඨිනානිශංස දේශනා වලින් කියවෙන්නේ දිව්‍ය ලෝක වල දිව්‍ය සැප සම්පත් හා මනුෂ්‍ය ලෝකවල මනුෂ්‍ය සම්පත් ලැබෙන බවයි. කඨිනය යනු ඉතා සරළ පුජාවකි. නමුත් ඒ පිංකම තරම් සංකිර්ණ පිංකමක් තවත් නැති තරම්ය. තනි තනියෙන් කඨින පිංකම් භාර ගැනීම අද මහා තරගයක් බවට පත්වී තිබේ. එසේ පිං කරන බොහෝ දෙනෙක් දෙව් ලෝ සැපතම අපේක්ෂා කරති. කලාතුරකින් කෙනෙක් තම සිත තුළ පවත්නා ලෝභාදී අකුශලයන් නැති කර නිවන අපේක්ෂාවෙන් ක්‍රියා කරනු ඇත. සමහරු මේ පිංකම් කරන්නේ හැකියාවක් ඇතිව නොවේ. රටට ණය වී එවැනි පිංකම් කරන අය සිටිති. පිංකම අවසන් වු පසු ඒ සඳහා කළ වියදම් ගැන තමා කොතරම් ණය වුනාද කියා සිතේ අසතුට ඇති කර ගනී. ඒ නිසා තමා මුලින්ම බලාපොරොත්තු වු කිසිවක් ඉටු කර ගැනීමට නොහැකි වේ. සමහර බෞද්ධයන් අද දානාදී පිංකම් කරන්නේ තරගයකට මුහුණ දීමක් ලෙසය. හැකියාව තිබෙන කෙනෙක් දෙන දානයක් දෙස බලා හිඳ හැකියාව නොමැති අයත් එසේ කිරිමට සූදානම් වනු අප කොතෙක් දැක තිබේද? එවැනි අවස්ථා වලදී හොඳ සිතින් ඒවාට අවවාද කළත් ඔවුන් කියන්නේ අපේ පිංකම පුංචි කරන්නට උපදෙස් දෙන බවයි. ඒ සඳහා හොඳට මතක තබා ගත යුතු වන්නේ ලෞකික සැප සම්පත් අපේක්ෂාවෙන් දන්දීම නොකළ යුතු බවත් නිවනම අපෙක්ෂාවෙන් එවැනි පිංකම් කළ යුතු බවත්ය.

පිංකම පුංචි කරන්නට උපදෙස් දෙන බවයි. ඒ සඳහා හොඳට මතක තබා ගත යුතු වන්නේ ලෞකික සැප සම්පත් අපේක්ෂාවෙන් දන්දීම නොකළ යුතු බවත් නිවනම අපෙක්ෂාවෙන් එවැනි පිංකම් කළ යුතු බවත්ය.

අපුත්තක සිටුවරයාට දරුවන් නොමැති වීමේ හේතුව අපි මුලින් සඳහන් කළෙමු. වර්තමාන සමාජයේද මෙවැනි අනුවණයන් දැකිය හැකිය. පසුගියදා පුවත් පතක එවැනි දෙයක් සටහන් වී තිබුණි. ගෙදරක මවක් පියෙක් සහ කුඩා දරුවන් දෙපලක් වාසය කරති. පියාගේ රැකියාව ඉංග්‍රිසි බෙහෙත් විකිණීමයි.මොහු දිනක් රැකියාවට යන විට තමා ගිය බසයේ තමා සිටි අසුනේ සිටි රූමත් කාන්තාවක් සමග කතාබහ කරමින් යයි. මොහු මෙතනදී රඟපාන්නේ තමා අවිවාහක පිරිමියෙක් ලෙසටයි. ඔහුගේ වචන වලට රැවටුණු එම කාන්තාව ඔහු සමග විවාහ විමට තීරණය කරයි. එහිදී එම අනුවණයා කියන්නේ මීට සතියකට පෙර මගේ පියා මිය ගියා. මේ දින වල තුන් මාසේ

දානය සඳහා සූදානම් වෙමි. දානය අවසන් වූ පසු අපි විවාහ වෙමු. මෙසේ දින කිහිපයක් ගත වූ පසු අර පුද්ගලයාගේ ස්වාමි දියණිය රාත්‍රී කාලයේ රෝගී වෙයි. මේ පුද්ගලයා බෙහෙත් කරල් දෙකක් ගෙනවිත් බොන ලෙස කියයි. ඇය එය ප්‍රතික්ෂේප කළත් නැවත නැවත ඇවටිලි කිරීම නිසා එම බෙහෙත් කරල් දෙක බොයි. බෙහෙත් බිව් පසු ඇයට වමනයක් ඇතිවිය. රෝහලට ඇතුල් කර සුළු වේලාවකින් ඇය මිය ගියාය. පසුව දැන ගත්තේ එම බෙහෙත් කරල් වලට වස මිශ්‍ර කර තිබූ බවයි. මිය ගිය කාන්තාවගේ මව කුඩා පුතුන් දෙපලගේ ආච්චි ඒ දෙදෙනා තමාගේ ගෙදරට එක්කරගෙන ගියාය. පොඩි පුතා ළදරු පාසලේ ඉගෙන ගනී. දෙවන පුතා දෙවන ශ්‍රේණියේ ඉගෙන ගනී. ටික දවසක් ගත වූ පසු අම්මාට දන්වා ඒ දරුවන් දෙදෙනාද ගෙදරට ගෙන්වා ගත්හ. පියා දරුවන් දෙදෙනා ඉල්ලන බැවින් ආච්චි දරුවන් දෙදෙනා පියාට භාර දුන්හ. ටික දිනක් ගිය පසු ඒ දෙදෙනා රෝගී වෙයි. මේ නුවණ නැති පියා ඒ දරුවන් දෙදෙනාටද විස සහිත බෙහෙත් දෙයි. ඒ දරුවන් දෙදෙනාද රෝහලේ දී මිය යයි. දැන් රෝහලට සැකයක් ඇති විය. වහාම පොලිසියට දැන්වීය. පොලිසිය ඇවිත් ගෙදර පරික්ෂා කරන විට ගේ තුළ විෂ මිශ්‍ර බෙහෙත් තිබුණි. ඉන් පසු මේ අනුවනයා පොලිසියට ගෙන යාමට සූදානම් වූ විට ඔහු කළේ කාමරයට ගොස් විෂ සහිත බෙහෙතක් සිරුරට එන්නත් කර ගැනිමයි. අන්තිමේදී ඔහුගේ ජීවිතයද අවසන් විය. මග දී දුටු කාන්තාවක් කෙරෙහි ඇති වූ ලෝභය නිසා තම බිරිඳ සහ කුඩා දරු දෙපල  මරා දැම්මට තරම් ද්වේෂයක් ඇති විය. එපමණක්ද නොව තම ජිවිතයද විනාශ කර ගැනිමට එම ද්වෙෂය බලවත් විය. මේ සියල්ලටම හේතුව මෝහය බව වටහා ගත යුතුය. එබැවින් නුතන අපුත්තක සිටුවරුන් සහ සිටු දේවිවරුන් නුවණින් ක්‍රියා කොට තම ජිවිතය සැපවත් කර ගැනිමට උත්සහවත් වන්න.

LAKRUHUNU.COM



ලක්රුහුණු මාසික දහම් පත්‍රය

අමා ගඟුල

2015 NOVEMBER

අනුවණයා වස්තු තණ්හාව නිසා නසින හැටි හඳුනා ගනිමු.